## 183 මොහොතින් මොහොතට

මොහොතින් මොහොතට දිවි ගෙවමු
හැම ගැටලුවකට මුහුණ දෙමු
සමිඳුන් අත ගෙන පිය තගමු
කරදර සිතටක ඉඩ නොදෙමු

සමිඳුන් වදහල බස් අසලා
පලමුව එකමුතු කම සොයලා
දැහැමිව කිතු රජකම පතලා
යමු යමු පෙරටම වෙත් නොවෙලා

විහඟුන් අටු කොටු පුරවත්ද
කන බොන දෑ ගැන දුකවෙත්ද
ලස්සන කුසුමෙන් විල සැරසේ
දෙව් පිය වැඩියෙන් අප රැකදේ

මඳ ඇදහිල්ලට ඉඩ නොදෙමු
කඳු සෙලවෙන ඇදහිම පතමු
සාමය සතුට ද අත් දැකලා
ප්‍රීතිය අප හද උතුරවලා